# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1989/14 - 2016 ඔක්තෝබර් මස 18 වැනි අඟහරුවාදා - 2016.10.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංක : IR/15/04/2008

### කාර්මික ආරාවුල් පනත 131 වැනි අධිකාරය

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2009.06.09 දිනැති හා අංක 1605/12 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2009.06.03 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් බත්තරමුල්ල, තලංගම උතුර, මුත්තෙට්ටුගොඩ පාර, අංක 727/1 හි ඩී. සී. ජයසිංහ මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොලොන්නාව, නිමාව හි පිහිටි සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2016.05.18 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. සී. අමරතුංග,
කම්කරු කොමසාරිස්.

2016 ඔක්තෝබර් මස 11 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

කොළඹ කාර්මික අධිකරණයේ දී ය.

ඩී. සී. ජයසිංහ මහතා,
අංක 727/1, මුත්තෙට්ටුගොඩ පාර,
තලංගම උතුර,
බත්තරමුල්ල.

නඩු අංකය : ඒ - 3292 හා

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ්
ටර්මිනල්ස් ලිමිටඩ්,
නිමාව,
කොලොන්නාව.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද

කම්කරු සබඳතා සහ මිනිස්බල අමාත්‍ය ආතාවුද සෙනෙවිරත්න මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා වෙත යොමු කර ඇත.

අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කාරණය වනුයේ

සිලෝන් පෙට්‍රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් ලිමිටඩ් විසින් එම සමාගමේ B-3 ශ්‍රේණියේ ලිපිකරු ඩී. සී. ජයසිංහ මහතාට එරෙහිව පවත්වනු ලැබූ විනය පරීක්ෂණයෙන් අනතුරුව, ඔහු වෙත පමුණුවනු ලැබූ දඬුවම් යුක්ති සහගතද යන්න හා යුක්ති සහගත නොවන්නේ නම්, ඩී. සී. ජයසිංහ මහතාට සමාගම වෙතින් කුමන සහනයක් ලැබිය යුතු වන්නේ ද යන්න පිළිබඳව ද වේ.

පැමිණිලිකාර සේවක මහතාට චෝදනාපත්‍රයක් ලබාදී විනය පරීක්ෂණයක් පවත්වා එකී විනය පරීක්ෂණයේදී ඔහු සියළුම චෝදනාවලට වරදකරු වී ඇත.

ඉහත සඳහන් කරුණු සිද්ධි සහ සාක්ෂි මත පදනම් වන අතර, ඉදිරිපත් වූ සාක්ෂි මත චූදිත නිලධාරී විෂයෙහි අදාළ චෝදනා ඔප්පු වූ හෙයින්, විනය පරීක්ෂණ නිලධාරී සියළුම චෝදනාවලට සේවක ඉල්ලුම්කරු වරදකරු කර ඇත.



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

එකී විනය පරීක්ෂණයේදී ස්වභාවික යුක්ති මූලධර්ම අනුගමනය කරමින් විනිවිදභාවයකින් යුතුව පවත්වන ලද බවත්, විනය විරෝධී කටයුතුවල යෙදීමේ ප්‍රවණතාවයක් දක්වන පැමිණිලිකාර ඉල්ලුම්කරුට යම් දඬුවමක් නොපමුණුවා සිටියහොත්, විශාල සේවක සංඛ්‍යාවක් සිටින මෙම ආයතනයේ විනය පවත්වාගෙන යාම දුෂ්කර විය හැකි බව නිගමනයට එළඹ ඇත. පැමිණිලිකරු වරදකරු වූ වරද වැනි වැරදි සඳහා ආයතනය විසින් ලබාදෙනු ලබන දඬුවම වනුයේ, සේවයෙන් ඉවත් කිරීමයි. මෙහිදී පැමිණිලිකරුව සේවයෙන් ඉවත් නොකර ඊට අඩු දඬුවමක් ඔහුට ලබාදීම මගින් පැමිණිලිකරුට යම් සහනයක් ලැබී ඇති බව මම නිගමනය කරමි.

විනය පරීක්ෂණයකදී ඔප්පු කිරීමේ භාරය විය යුත්තේ, සාධාරණ සැකයෙන් තොරව ඔප්පු වීමක් හෝ ශක්‍යතා වැඩිබර සාක්ෂි මත ඔප්පු වීමයි. එහෙත් ඉදිරිපත් වූ සාක්ෂි විමසා බැලීමේදී පෙනී යන්නේ, චෝදනා වූ පරිගණකයට යම්කිසි දෙයක් ඇතුළත් කිරීම හෝ ගබඩා කළමනාකාරිණියට බැනවැදී තර්ජනය කිරීම හෝ වෙනත් පුද්ගලයෙකු ඇසින් දුටු බවට කිසිදු සාක්ෂියක් ඉදිරිපත් වී නොමැත.

එහෙයින් චූදිත නිලධාරී කෙරෙහි සැකයක් ජනිත කිරීමට හෝ තුඩුදුන් සාක්ෂි ඉදිරිපත් නොවූ බව මාගේ හැඟීමයි. ඒ අතරම පරිභාවයට ලක්වූ ගබඩා කළමනාකාරිණිය හදිසි කෝපයට පත්ව ඒ අවස්ථාවේදීම ප්‍රතික්‍රියාවක් දක්වනු විනා දින 8 කට පසුව ඒ පිළිබඳව පැමිණිලි කිරීමට පෙළඹීම සාමාන්‍ය පියවි ඇසින් බලන්නෙකුට කිසිසේත් විශ්වාස කළ නොහැකි කරුණක් නොවන බව මා නිගමනයට එළඹිණි. මෙම චෝදනාව චූදිත නිලධාරී විෂයයෙහි ඔප්පු වූවා සේ සැළකීමට නොහැකි අතර, ඒ සඳහා දණ්ඩනයකට යටත් කිරීම දෙවතාවක් සළකා බැලිය යුතු කරුණක් වේ.

තවද, ආයතනයේ යහපත් පැවැත්ම හා මනා ක්‍රියාකාරිත්වයද නොමඳ සහයක් ලබා දී ඇති බවත්, ඉදිරියේදී එසේ ලබාදීමට අපේක්ෂා කරන බවත්, විනය පරීක්ෂණය අවසානයේ සිට මේ දක්වා මානසික පීඩනයක් හා මූල්‍ය පාඩුවට ලක් වීමත් සිදු වී ඇති බවත්, ශ්‍රේණි දෙකකින් පහත හෙළීම ඇතුළු විනයානුකූල ස්ථාන මාරු දෙකක් සහිතව සැහෙන දඬුවම් විඳ ඇති බවත් ඉල්ලුම්කරු ප්‍රකාශ කර ඇත. ඉහත කරුණු පිළිබඳවද මාගේ අවධානය යොමු කරමි.

මේ අනුව ගරු අධිකරණයෙන් විසඳිය යුතුව ඇත්තේ, මෙහි පළමු පාර්ශ්වයේ ඉල්ලුම්කරු වන ඩී. සී. ජයසිංහ යන අයට විරුද්ධව දෙවන පාර්ශ්වය වන සේවායෝජක ආයතනය විසින් විනය පරීක්ෂණයක් පවත්වා ලබා දී ඇති දඬුවම් යුක්ති සහගතද යන්න ගැන තීරණයක් ලබා දීම බැව් ප්‍රකාශ කර සිටී.

B-2 ශ්‍රේණියේ ලිපිකාර තනතුරේ සේවය කරමින් සිටියදී 2006.02.24 දින චෝදනාපත්‍රයක් නිකුත් කොට විනය හේතු මත ගබඩා අංශයේ සිට වෛද්‍ය මධ්‍යස්ථානයට ස්ථානමාරු කළ විනය පරීක්ෂණයක් පවත්වා ඉන් අනතුරුව පිරිස් කළමණාකරුගේ 2016.11.16 දිනැති ලිපිය මගින් චෝදනාවලට වරදකරු කරමින් B-2 ශ්‍රේණියේ ලිපිකරු තනතුරේ සිට B-4 ශ්‍රේණියේ ලේඛණ භාරකරු වශයෙන් ශ්‍රේණි දෙකක් හා තනතුරු දෙකක් පහත හෙලමින් ආරක්ෂක අංශයට ස්ථානමාරු කරමින් දඬුවමක් ලබාදී ඇත. ඉල්ලුම්කරු මෙම අධිකරණයේ වගඋත්තරකරුගේ හරස් ප්‍රශ්ණවලට යටත්ව සාක්ෂි ඉදිරිපත් කළ අතර, තමාට විරුද්ධව ඉදිරිපත් කර ඇති 2006.02.24 දිනැති චෝදනාපත්‍රයද ''A2'' වශයෙන් ලකුණු කර ඇත. A2 පළමු චෝදනාවෙන් කියවෙන්නේ 2005.08.22 දින හෝ ඊට ආසන්න දිනකදී අඩ නිරුවත් ගැහැණු පින්තූර ගබඩා කාර්යංශයේ පරිගණකයට ඇතුල් කොට එය ප්‍රදර්ශණය වන ආකාරයට තැබීම. මෙම කාරණය ඔප්පු කිරීමද ඉතාම පහසු වේ. එහෙත් පැමිණිලිකරු පරිගණකයට එකී ඡායාරූපය ඇතුල් කරනවා ඇසින් දුටු සාක්ෂියක් ඉදිරිපත් වී නොමැත. චෝදනාව සැකයෙන් තොරව ඔප්පු වී නැත. ඒ පිළිබඳව ගරු අධිකරණයේ අවධානය යොමු විය. ඇසින් දුටු සාක්ෂියක් වගඋත්තරකරු විසින් ඉදිරිපත් කොට චෝදනාව ඔප්පු කිරීමට අපොහොසත් වී ඇත. ඒ සමගම ඉදිරිපත් කර ඇති අනිකුත් චෝදනාද ඇසින් දුටු සාක්ෂි මත ඔප්පු කිරීමට වගඋත්තරකාර පාර්ශ්වය අපොහොසත් වී ඇත. ඉහත කරුණුද සළකා බලා ලිඛිත සාක්ෂිය තුලානාත්මකව අධ්‍යයනය කිරීමෙන් තහවුරු වන්නේ, ඉල්ලුම්කරුගෙන් පළිගැනීම උදෙසාම සාක්ෂි නිර්මාණශීලීව ඉදිරිපත් කළ බවත් ඉල්ලුම්කරු ප්‍රකාශ කළද එය පදනම් විරහිත වේ. සාක්ෂි මතම ඔප්පු වී නැති බැව් ගරු අධිකරණයට තහවුරු වී ඇත. එහෙත් වරදක් සිදු වී ඇති බව අධිකරණයට බැහැර කළ නොහැක.

ඉල්ලුම්කරුගේ ඉහත ක්‍රියාවන් පිළිබඳව විමසිල්ලෙන් සාක්ෂි විභාගයේදී බලා සිටියද, ඉල්ලුම්කරුගේ පෙර හැසිරීම පිළිබඳවද ඉදිරිපත් වූ කරුණු බැහැර කළ නොහැක. මේ අනුව ඉල්ලුම්කරුට විරුද්ධව ඉදිරිපත් කරන ලද 4 වන චෝදනාව වගඋත්තරකරුගේ සාක්ෂි මගින් බැහැර වී යන බව මාගේ නිගමනයයි.

ඊට අමතරව ''A2'' චෝදනාපත්‍රයේ 5 වන චෝදනාව මගින් කියා ඇත්තේ, 1, 2, 3 සහ 4 යන චෝදනාවල නිරත වීම නිසා රාජකාරී කටයුතු විශ්වාසවන්තව, කාර්යක්ෂමව හා උද්යෝගයෙන් කිරීමට අපොහොසත් වූවාය යනුවෙනි. ''A2'' හි ඉහත සඳහන් සියළු චෝදනා කිසිවක් සනාථ වී නොමැති බැවින්, මෙම චෝදනා කිසිසේත් අදාළ නොවන බව පිළිගත යුතු කරුණක් වේ.

මින් පෙර ගරු අභියාචනා අධිකරණයේ තීරණය කර ඇත්තේ, ප්‍රධාන කනකපුල්ලේවරයෙකු වශයෙන් සේවය කළ ඉල්ලුම්කරු පසුව සහකාර කනකපුල්ලේවරයෙකු වශයෙන් නැවත පත් කිරීම සේවයෙන් පහත හෙලීම තුලින් සේවකයාගේ සේවය අනුමිත ලෙස අවසන් කිරීමක් වගඋත්තරකරු විසින් සිදුකොට ඇති බවකි.

ඒ අනුව සළකා බැලීමේදී මෙම නඩුවේ සේවායෝජක වගඋත්තරකරු මෙම පැමිණිලිකරුට රැකියාව එපා වන තත්ත්වයකට පත්කොට අනුමිත ලෙස සේවය අවසන් කිරීමට කටයුතු කර ඇත්ද යන්නද මා විසින් සළකා බලන ලදී. මේ සියළුම කරුණු ඉතා සියුම් ලෙස විශ්ලේෂණය කර බැලීමේදී පැමිණිලිකරුට දැඩි දඬුවම් පමුණුවා අගතියක් සිදු වී ඇති බව මා තීරණය කරමි.

එහෙත් දඬුවම් ලබාදීමේදී ඉල්ලුම්කරුගේ මුල් තනතුරේ හා ශ්‍රේණියේ වැටුප් හෝ දීමනා කිසිවක් අඩු කර නොමැති හෙයින්, ඔහුට මූල්‍යමය පාඩුවක් සිදු වී නොමැත.

ඒ අනුව ඉල්ලුම්කරුව B-2 ශ්‍රේණිය දක්වා නැවත උසස්වීම ලබා දීමට නියෝග කරමි.

මෙම පත්වීම 2014 අප්‍රේල් මස 01 වන දින සිට ක්‍රියාත්මක විය යුතු බවට ප්‍රකාශ කරමි.

මෙම ප්‍රදානය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළවී මාස තුනක් ඇතුළත මෙම නියෝගය ක්‍රියාත්මක විය යුතු බවට ප්‍රකාශ කරමි.

එය සාධාරණ හා යුක්ති සහගත යැයි මාගේ හැඟීම හෙයින් ඒ අනුව මාගේ ප්‍රදානය මෙසේ නිකුත් කරමි.

නීතිඥ කේ. ඒ. ට්‍රෙවෝ ප්‍රනාන්දු,
බේරුම්කරු,
කාර්මික අධිකරණය.

2016 මැයි මස 18 දින දී ය.

11 - 94

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.